රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල

4 ශ්‍රේණිය - 2020

ගණිතය

දෙවන වාරය පැවරුම් අංක 03

මැයි 04 සිට 06 තෙක්

- දෙමව්පියන් සඳහා උපදෙස්,
  - මෙම අභ්‍යාස පොතක කරවන්න. හැකි නම් මුද්‍රණය කර දරුවාට ලබා දෙන්න.
  - පිළිතුරු පමණක් දරුවාට ලිවීමට සලස්වන්න. ප්‍රශ්න දෙමව්පියන් විසින් ලියා දෙන්න.
  - හැකිනම් පිළිතුරු හා අකුරු නිවැරදි කරන්න.
  - මෙම අභ්‍යාස වයිබර් කණ්ඩායම් මගින් හුවමාරු කර ගන්න.
  - පාසල ආරම්භ වන දිනක මෙම පොත රැගෙන එන්න.
  - අවශ්‍ය අවස්ථාවල දී ළමයින්ගේ වැඩවලට දෙමව්පියන් සහය වන්න.

පාඩම් අංක 15 දිශා

<u>ක්‍රියාකාරකම අංක 01</u>

1. ඔබේ දරුවාත් සමග පෙරවරු 8.00 ත් 9.00ත් අතර එළියට යන්න.
2. ඉර පායන දිශාව පෙන්වන්න.
3. එය <u>නැගෙනහිර දිශාව</u> බව කියා දෙන්න.
4. එය සැමදා වෙනස් නොවන දෙයක් බව තහවුරු කරන්න.
5. දැන් ඉදිරියේ ඇති පින්තූරයේ ආකාරයට දෑත් දෙපසට විහිදුවා නැගෙනහිර දිශාව බලා සිට ගැනීමට කියන්න.



6. දැන් දරුවාගේ පිටු පසින් ඇති දිශාව **<u>බස්නාහිර</u>** (බටහිර) දිශාව බව කියා දෙන්න. එය ඉර බැස යන දිශාව බව කියා දෙන්න.
7. දැන් දරුවාගේ දකුණු අත කුමක් දැයි අසන්න. අමතක නම් දකුණු අත දරුවාට මතක් කර දෙන්න. දකුණු අත පැත්තේ ඇත්තේ <u>දකුණු දිශාව</u> බව කියා දෙන්න.
8. දැන් දරුවාගේ වම් අත කුමක් දැයි අසන්න. අමතක නම් වම් අත දරුවාට මතක් කර දෙන්න. වම් අත පැත්තේ ඇත්තේ <u>උතුරු දිශාව</u> බව කියා දෙන්න.

අද ඉගෙන ගත්තේ ප්‍රධාන දිශා හතර බව කියා දෙන්න.



9. ප්‍රධාන දිශා හතර තුළ පිහිටා ඇති දේවල් විමසන්න.

- ❖ නැගෙනහිර දිශාව පැත්තේ ඇති දේවල් විමසන්න.

උදාහරණ- ගසක නමක්, නිවස, ළිඳ, යනාදි වශයෙන් පිහිටා ඇති දේවල් ගැන විමසන්න.

- ❖ බටහිර දිශාව පැත්තේ ඇති දේවල් විමසන්න.
- ❖ දකුණු දිශාව පැත්තේ ඇති දේවල් විමසන්න.
- ❖ උතුරු දිශාව පැත්තේ ඇති දේවල් විමසන්න.

<u>ක්‍රියාකාරකම අංක 02</u>

● = ළමයා

01. ඔබේ දරුවාත් සමග එළියට යන්න.

02. නැගෙනහිර දිශාව බලා සිට ගැනීමට කියන්න.

03. දකුණු අත පැත්තට හැරෙන්න කියන්න. දැන් මුහුණලා සිටින දිශාව කුමක්දැයි අසන්න.




04. නැවත වම් අත පැත්තට හැරෙන්න කියන්න. දැන් මුහුණලා සිටින දිශාව කුමක්දැයි අසන්න.




05. දැන් පිටුපසට හැරෙන්න කියන්න. දැන් මුහුණලා සිටින දිශාව කුමක්දැයි අසන්න.



06. මේ ආකාරයට දරුවා ප්‍රධාන දිශාවන්ට හරවා ඇති දිශාව විමසන්න.

වම් අත පැත්තට හෝ දකුණු අත පැත්තට හැරීමේ දී වට කාලක් ( $\frac{1}{4}$ ) පමණක් හැරෙන බව දරුවාට පවසන්න. ආපසු හැරීමේ දී (පිටුපසට හෝ ඉදිරිපසට) වට බාගයක් ( $\frac{1}{2}$ ) හැරෙන බව පවසන්න.

<u>ක්‍රියාකාරකම අංක 03</u>

01. පහත දැක්වෙන ආකාරයට දිශා සටහනක් සකස් කර ගන්න. මේ සඳහා ලී පටි දෙකක් හෝ සිහින් දිග කෝටු 2ක් යොදා ගත හැකිය. අග කාඩ්බෝඩ් කෑලි 4ක දිශා හතර ලියා රඳවන්න.




02.මෙම දිශා සටහනත් රැගෙන දරුවා සමග එළියට ගොස් පහත දේ සිදු කරන්න.

- දරුවාට උතුරු දිශාවට මුහුණලා සිට ගන්න කියන්න.
- පියවර 5ක් ඉදිරියට යන්න.
- දකුණු දිශාවට හැරෙන්න.
- පියවර 10ක් ඉදිරියට ගොස් බස්නාහිර දිශාවට හැරෙන්න.
- පියවර 5ක් ඉදිරියට යන්න.
- මේ ආකාරයට දිශා හඳුනා ගන්නා තෙක්

ක්‍රියාකාරකම සිදු කරන්න.



## ක්‍රියාකාරකම අංක 04

1. පහත ආකාරයේ කොටු කොළයක් දරුවාට දෙන්න. (මෙය දෙමව්පියන් විසින් දරුවාට ලබා දෙන්න. දිගට කොටු 15ක් හා පළලට කොටු 15ක්)
2. මෙවැනි කොළයක හෝ අභ්‍යාස පොතේ දිශා දැක්වීමේ දි සෑම අවස්ථාවක ම උතුරු දිශාව ඉහළ පැත්තේ තිබෙන බව තහවුරු කරන්න.







මෙම දිශා සටහන හැරෙන ස්ථානවලට තබා බැලිය හැක.

- කොටු 3ක් නැගෙනහිර දිශාවට රේඛාවක් අඳින්න. (සෑම අවස්ථාවක ම මේ සඳහා පාට පැන්සලක් යොදා ගන්න.)
- කොටු 3ක් උතුරු දිශාවට රේඛාව අඳින්න.
- කොටු 4ක් බටහිර දිශාවට රේඛාව අඳින්න.
- කොටු 3ක් උතුරු දිශාවට රේඛාව අඳින්න.
- කොටු 8ක් නැගෙනහිර දිශාවට රේඛාවක් අඳින්න
- කොටු 6ක් උතුරු දිශාවට රේඛාවක් අඳින්න
- කොටු 4ක් බටහිර දිශාවට රේඛාව අඳින්න.
- කොටු 2ක් දකුණු දිශාවට රේඛාව අඳින්න.

- පහත දැක්වෙන පින්තූරය දෙස බලන්න. එක් එක් දේවල් පිහිටා ඇති ආකාරය බලමු.




- ගෙට උතුරු දිශාවෙන් ඇත්තේ වී බිස්ස.
- ගෙට දකුණු දිශාවෙන් ළමයා සිටියි.
- ගෙට බටහිර දිශාවෙන් ගසක් ඇත.
- ගෙට නැගෙනහිර දිශාවෙන් ළිඳක් ඇත.
- ගසට නැගෙනහිර දිශාවෙන් නිවස සහ ළිඳ ඇත.
- ළිඳට බටහිර දිශාවෙන් නිවස සහ ගස ඇත.
- වී බිස්ස ඇත්තේ නිවසට උතුරු දිශාවෙනි.
- ළමයාට උතුරු දිශාවෙන් නිවස සහ වී බිස්ස ඇත.

ගණිතය පෙළ පොතේ පිටු අංක 51, 52, 53 හි ඇති අභ්‍යාස කරන්න.